රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය - 2023

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා 2023.12.31 දිනට සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන බලයලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම විභාගය මඟින් බඳවා ගැනීම් සිදු කරනුයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා වේ. වෙනත් ආකාරයකින් සුවිශේෂ කොට නොමැති අවස්ථාවන්හිදී "තනතුර" යන පදයෙන් අදහස් කරනුයේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර වේ.

2. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය 2024 ජූලි මස 05 වන දින වේ.

   2.1. ලිඛිත විභාගය -
   මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.
   (උප ලේඛන 1 බලන්න)

   2.2. විභාග දිනය -
   මෙම විභාගය 2024 අගෝස්තු මස කොළඹදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇත.

   2.3. විභාගය පවත්වන බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින්

   2.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

   (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්

3. පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් සංඛ්‍යාව 38 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබනු ඇති අතර, මෙම උසස්වීම ක්‍රියාත්මක වන දිනය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දිනය වේ.

4. සේවා කොන්දේසි :

   4.1.රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධාන වලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලටද, 2013.12.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන්ට හා කොන්දේසි වලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින්

මතුවට කෙරෙන්නා වූ සංශෝධන වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරට පත් කෙරෙනු ඇත.

4.2.මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

5. මාසික වැටුප් පරිමාණය :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 41,580-11x755-18 x1030-68425 වේ. ඒ අනුව මෙහි 6 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

6. බඳවා ගැනීමේ ක්‍රමය

6.1. ලිඛිත විභාගය

6.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

7. බඳවා ගැනීමේ සුදුසුකම්

i. බලයලත් නිලධාරී I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. බලයලත් නිලධාරී II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව තිබීම.

8. වෙනත් කරුණු

a. කායික සුදුසුකම් :

8.1 සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

8.2 තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් කර ඇති සියලු සුදුසුකම් 2023.12.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

b. වෙනත් සුදුසුකම් :

(i) <u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධික පන්තිය සේවා ගණයේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ 7.4.3.1 ප්‍රකාරව</u> ලිඛිත විභාගයෙන් සමත් සියලු අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) ලිඛිත විභාගයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ.

(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදීම සුදුසුකම් පරීක්ෂා කිරීම ද සිදු කරනු ලැබේ.

(iv) සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

9. වෙනත් කොන්දේසි

9.1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන්ම ගුවන් තොටුපළ හා වරායවල ද ස්වකීය රාජකාරි ඉටු කිරීම සඳහා බැඳී සිටිය යුතුය.

9.2 අදාළ තනතුරට බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවයන් ද සියලු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

9.3 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

9.4. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

10. විභාග ගාස්තු

විභාගය සඳහා වූ ගාස්තුව රු.2,000.00 කි. මෙම විභාග ගාස්තු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7039793 ට බැර වන ලෙස දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

11. අයදුම් කිරීමේ ක්‍රමය

a. අයදුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

b. අයදුම්පත මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 ½ X12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ යුතුය. එම අයදුම්පත සිය අත් අකුරින් හෝ පරිගණකයෙන් හෝ යතුරු ලියනය කර හෝ සකස් කර ගත හැකිය. අංක 01 සිට 10 තෙක් අයදුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේද 11 සිට 14 තෙක් එහි දෙවන පිටුවේ ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස් කර ගත යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳ විමසා බැලීම අයදුම්කරුගේ වගකීමකි. (අයදුම්කරු විසින් අයදුම්පතේ ඡායා පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

c. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් අංශ ප්‍රධානියා මඟින් 2024.07.05 වැනි දිනට පෙර ලැබෙන සේ ආගමන හා විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් අතේ රැගෙනවිත් පාලන අංශයේ අදාළ විෂය භාර කළමනාකරණ සේවා නිලධාරී වෙත භාර දී ලද බවට ලිපියක් ලබා ගත යුතුය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ජොෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ කුසලතා තරග විභාගය - 2023" යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

d. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් හෝ සහතික කර තිබිය යුතුය.

e. තැපෑලේදී යම් ඉල්ලුම් පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

f. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, 0112101553 දරන දුරකථන අංක ඔස්සේ ඒ බව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක (පාලන) වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් (0115980257) මඟින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

12. විභාගයට ඇතුළු වීම

a. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. විභාග දින එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකු හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

b. අපේක්ෂකයන් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර සෑම අපේක්ෂකයකුම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය එම විභාග ශාලාවේදී පළමුවෙන්ම පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය.

c. සටහන - විභාග අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් ඇරීම සඳහා හෝ මෙම නිවේදනය මඟින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාව

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.

අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවකදී එම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

15. විභාගය පැවැත්වීම

a. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

b. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

c. තම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

16. විභාග ප්‍රතිඵල

a අපේක්ෂකයන් ලිඛිත විභාගයේදී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණු ඇතුළත් කර කුසලතා අනුපිළිවලට සකස් කළ ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත. අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව අදාළ ප්‍රතිඵල ලේඛනය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලබා දීමෙන් පසුව එය එම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කෙරෙනු ඇත.

b. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්

වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

17. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් හෝ නොගැළපීමක් වේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

අයි. එස්. එච්. ජේ. ඉළුක්පිටිය
ආගමන හා විගමන පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2024 ජූනි මස ..10....... වැනි දින
සුහුරුපාය,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

## ලිඛිත විභාගයේ විෂය නිර්දේශය හා ලකුණු පටිපාටිය

- ලිඛිත විභාගය සඳහා පිරිනැමෙන උපරිම ලකුණු සංඛ්‍යාව 40 කි

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් අවම ලකුණු |
|---|---|---|---|---|
| I ප්‍රශ්න පත්‍රය | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 04නික් යුක්ත වන අතර එක් කොටසක් සඳහා ලකුණු 25 බැගින් හිමි වේ.<br>(i) ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී රාජකාරියට අදාළ කාර්ය ආවරණය වන සිද්ධි අධ්‍යයනයක් පිළිබඳ ප්‍රශ්න<br>(ii) ජාත්‍යන්තර ගුවන් සේවා සංවිධානයේ රෙගුලාසි, ජාත්‍යන්තර ගුවන් සේවාවන්ට අදාළ ද්විපාර්ශවික හා බහු පාර්ශවික ගිවිසුම් යනාදිය පිළිබඳ ප්‍රශ්න<br>(iii) කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න<br>(iv) ඉංග්‍රීසි භාෂා දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කළ ප්‍රශ්න | පැය 02 | 100 | 40 |
| II ප්‍රශ්න පත්‍රය | ආගාමික හා විගාමික පනත, පුරවැසි පනත හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (එම පනත්වලට කරන ලද සංශෝධන සහ ඒවාට අදාළව පනවා ඇති රෙගුලාසි ද ඇතුළත්ව) ආශ්‍රිතව සකස් කරන ලද ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය 02 | 100 | 40 |

## උප ලේඛනය 2

### ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පිරිනැමෙන උපරිම ලකුණු 60 කි

අතිරේක සේවා පළපුරුද්ද සඳහා 2019.06.13 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හි විධිවිධාන ප්‍රකාරව පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.<br><br>අනෙකුත් නිලධාරීන් සඳහා ජ්‍යෙෂ්ඨතාවය = (ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ අමතර සේවා කාලය (අවු x12+මාස)) x අදාළ නිලධාරියාගේ අමතර සේවා (අවුරුදු x12+මාස) | 60 | අදාළ නොවේ |
| මුළු ලකුණු | 60 | |